# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1988/14 – 2016 ඔක්තෝබර් 11 වැනි අඟහරුවාදා – 2016.10.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: IR/22/02/2014.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එක් පාර්ශ්වයක් වශයෙන්,

ඩී. එස්. එම්. විජේසිංහ මයා, වැත්තෑව පාසල ඉදිරිපිට, වැත්තෑව, දඹදෙණිය

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී, අංක 106, යටිනුවර වීදිය, මහනුවර.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් වේයන්ගොඩ, පත්තලගෙදර, මොරටුවත්ත, අංක 114/1හි, පී. දනන්සූරිය මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 ඔක්තෝබර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

1A – G 24350 – 52 (2016/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/22/02/2014.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,

ඩී. එස්. එම්. විජේසිංහ මයා, වැත්තෑව පාසල ඉදිරිපිට, වැත්තෑව, දඹදෙණිය

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී, අංක 106, යටිනුවර වීදිය, මහනුවර.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ–

කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හි සේවය කළ ඩී. එස්. එම්. විජේසිංහ නමැති සේවක මහතාට 2012.04.01 දින සිට 2013.03.31 දින දක්වා සහ 2013.04.01 දින සිට 2014.03.31 දින දක්වා කාලයන්ට අදාළ වාර්ෂික වැටුප් වර්ධක, ප්‍රසාද දීමනා හා ලාබ කොටස් තමාට ලබා නොදීමෙන් අසාධාරණයක් වූ බවට ඔහු විසින් කරනු ලබන ඉල්ලීම යුක්ති සහගත වන්නේ ද යන්න සහ එලෙස යුක්ති සහගත වන්නේ නම් ඔහුට හිමි විය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2016 අගෝස්තු මස 19 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

10 – 1537

---

මගේ අංකය: IR/COM/03/P/2015/173.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එක් පාර්ශ්වයක් වශයෙන්,

එන්. ධර්මකීර්ති මයා, අංක 88/5, කල්දෙමුල්ල පාර, මොරටුව

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

සීමාසහිත විදුලි (පුද්ගලික) සමාගම, අංක 411, ගාලු පාර, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් දිවුලපිටිය, මාපලන්ගෙදර, අංක 160හි, කේ. එම්. සරත්චන්ද්‍ර මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 ඔක්තෝබර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/P/2015/173.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වැනි කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

එක් පාර්ශ්වයක් වශයෙන්,

එන්. ධර්මකීර්ති මයා, අංක 88/5, කල්දෙමුල්ල පාර, මොරටුව

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

සීමාසහිත විදුලි (පුද්ගලික) සමාගම, අංක 411, ගාලු පාර, කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය** වනුයේ–

2008.08.01 දින සිට 2013.07.31 දින තෙක් සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ විමර්ශන ඒකකයේ විමර්ශන නිලධාරියෙකු ලෙස සේවය කළ එන්. ධර්මකීර්ති මහතා, එම ආයතනය විසින් ගෙන ඇති අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 92/7/2 සහ 1991.07.20 දිනැති චක්‍රලේඛ අංක OPR/PLN/82 සහ ඊට අමතරව SIU/IM/04 හා 2012.01.02 දිනැති විමර්ශන කළමනාකරුගේ කරුණු දැක්වීම සැලකිල්ලට ගෙන සාමාන්‍යාධිකාරිගේ නිර්දේශය මත ආයතනයේ සභාපති විසින් ලබා දී ඇති අනුමැතිය ද පදනම් කර ගනිමින්, නීති විරෝධී විදුලිය ගැනීම් පිළිබඳ වැටලීම් තුළින් සමාගම වෙත අයකර ගන්නා ලද දඩ මුදලින් විමර්ශන නිලධාරියාට ලැබිය යුතු දිරි දීමනා ප්‍රමාණය ඉල්ලීම යුක්ති සහගත වන්නේ ද යන්න සහ එසේ යුක්ති සහගත වන්නේ නම් ඔහුට හිමි විය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2016 අගෝස්තු මස 15 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

10 - 1538

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.